# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## බී.වයි. තුඩාවේ සමාජ සත්කාරක පදනම
## (සංස්ථාගත කිරීමේ)

**බී.වයි. තුඩාවේ සමාජ සත්කාරක පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

දිගාමඩුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රිනී ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය විසින් 2016 මැයි මස 05 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2016 මාර්තු මස 21 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[107 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

## බී.වයි.තුඩාවේ සමාජ සත්කාරක පදනම
## (සංස්ථාගත කිරීමේ)

**බී.වයි.තුඩාවේ සමාජ සත්කාරක පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

''බී.වයි. තුඩාවේ සමාජ සත්කාරක පදනම'' යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව, එකී පදනමට සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා එකී පදනම විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මෙම පනත 2016 අංක දරන බී.වයි.තුඩාවේ සමාජ සත්කාරක පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (1) මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට හා ඉන් පසු (මෙහි මින් මතු ''පදනම'' යනුවෙන් සඳහන් කරනු ලබන) ''බී.වයි.තුඩාවේ සමාජ සත්කාරක පදනමේ'' දැනට සාමාජිකයන් වශයෙන් සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන පදනමට සාමාජිකයන් වශයෙන් මින්මතු බඳවාගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු ''පදනම'' යනුවෙන් සඳහන් කරනු ලබන) ''බී.වයි.තුඩාවේ සමාජ සත්කාරක පදනම'' යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති පදනමක් විය යුතු ය. තව ද එකී නාමයෙන් ඒ පදනම විසින් ද, ඊට විරුද්ධව ද නඩු පැවරිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගැනීමේ සහ එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, සම්පූර්ණ බලය හා අධිකාරය ඒ පදනමට ඇත්තේ ය. බී.වයි.තුඩාවේ සමාජ සත්කාරක පදනම සංස්ථාගත කිරීම.

(2) පදනම 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන පදනමේ කටයුතු කළමනාකරණය සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

පදනමේ පොදු පරමාර්ථ.

**3.** (1) පදනම සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ප්‍රජාවට අවශ්‍ය ඔවුන් පිළිගන්නා ඔවුන්ට දරා ගත හැකි තිරසාර සංවර්ධන ප්‍රවේශයක් ක්‍රියාත්මක කිරීම;

(ආ) විනය හා සංස්කෘතික සාරධර්මයන් ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යෑම සඳහා විධිවිධාන සැළැස්වීම;

(ඇ) අධ්‍යාපන, හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා පුස්තකාල පවත්වාගෙන යෑම;

(ඈ) දිළින්දන්, අසරණ වූවන් සහ රෝගීන්හට ආහාර සහ වෛද්‍යාධාර සැපයීම;

(ඉ) ජ්‍යෙෂ්ඨ පුරවැසි ව්‍යාපාර මගින් සපයනු ලබන සේවාවන් පුළුල් කිරීම සඳහා එම ව්‍යාපාරවලට සහාය වීම හා දිරිගැන්වීම ;

(ඊ) සියලුම ආගම්වලට අයත් ආගමික ස්ථාන සංවර්ධනය කිරීම සඳහා සහාය වීම;

(උ) ආධාර ලැබීමට සුදුසු දරුවන්ගේ පෙර ළමාවිය සංවර්ධනය කිරීම උදෙසා පෙර පාසල් පිහිටුවීම සහ පවත්වාගෙන යාම ;

(ඌ) ආදළ ආයතනවලට එකඟතාව ඇතිව අදළ ආයතන සමග පහත සඳහන් කාරණාවල දී සහාය වීම ;

(i) ළමුන්ගේ සහ කාන්තාවන්ගේ අභිවෘද්ධිය සඳහා සමාජගත කිරීමේ වැඩසටහන්, අධ්‍යාපනික සහ පුහුණු වැඩසටහන් නිර්මාණය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සහාය වීම ;

(ii) අඩු ආදායම් ලාභී පවුල්වල තරුණයන්ගේ යහපත පිණිස ඉංජිනේරු ශිල්පය, තාක්ෂණය, වඩු කර්මාන්තය, රියදුරු පුහුණුව සහ පරිගණක තාක්ෂණය ඇතුළු විවිධ විෂයයන් පිළිබඳ ස්වයං රැකියා අරමුණු කරගත් වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාතමක කිරීම; සහ

(iii) ආධාර ලැබීමට සුදුසු පාසල් ශිෂ්‍යයන්ගේ අධ්‍යාපනය නගා සිටුවීමේ අරමුණ පෙරදැරිව අමතර පන්ති, සම්මන්ත්‍රණ , වැඩමුළු, දේශන ප්‍රදර්ශන සහ අධ්‍යාපන චාරිකා සංවිධානය කිරීම.

(එ) ආධාර ලැබීමට සුදුසු සිසුන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම මගින් ඔවුන් වෙත උපකාර කිරීම ;

(ඒ) පදනමේ පරමාර්ථ වැඩිදියුණු කිරීම පිණිස උපකාර දක්වන යම් ආයතනයක යම් සේවයකයෙකුට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම ;

(ඔ) පදනමේ පරමාර්ථවලට සමාන පරමාර්ථ සහිත සංවිධාන හා ආයතන සමග අවබෝධතාව, සහයෝගීතාව සහ මිත්‍රත්වය වර්ධනය කර ගැනීම ; සහ

(ඕ) පාසල් යන වයසේ පසුවන එහෙත් විවිධ හේතු මත පාසල් නොයන ළමුන් හඳුනාගැනීම සහ ඔවුන් පාසල් වෙත යොමු කිරීමට සහාය වීම සහ සාමාජයීය සහ ආර්ථික සහයෝගය ලබාදීම තුළින් ඔවුන්ගේ අධ්‍යාපනයට සහාය විම ;

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කොට ඇති පරමාර්ථ ක්‍රියාවට නැංවීමේ දී වර්ගය, ආගම භාෂාව කුලය, ස්ත්‍රී පුරුෂ භාවය දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජනය නොකර ක්‍රියාත්මක කිරීමට පදනම සහතික විය යුතු ය.

පදනමේ කටයුතු කළමනාකරණය කිරීම.

**4.** (1) සංස්ථාවේ කටයුතු මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත් කාලයේ පවත්නා රීතිවලට යටත්ව සහ එම රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු එකොළොස් දෙනකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුවම වූ දිනයේ දී භාරයේ පාලක මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**5.** බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදානයන් හා පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද, සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කිරීමේ, සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ එහි යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු හෝ දේවල් කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පදනමට ඇත්තේ ය.

පදනමේ නීති.

**6.** (1) පදනමේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ පදනමේ රැස්වීම්වල ගණපූරණය ඇතුළු පහත දැක්වෙන සියලුම කරුණු හෝ ඉන් කිසිවක් හෝ සඳහා මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන රීති, පදනමේ සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් කලින් කළ පදනම විසින් සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකයන් විසින් ගෙවිය යුතු සාමාජික ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, අස්කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම ;

(ආ) භාරයේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම හා පැවැත්වීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය, එකී රැස්වීම්වල ගණපූරණය ද, ඔවුන්ගේ බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම ;

(ඇ) පදනමේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඈ) පදනමේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු වීම සඳහා අවශ්‍ය කරන සුදුසුකම් ;

(ඉ) පදනමේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම.

(2) පදනම විසින් සාදනු ලබන කිසියම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන් ම එවැනිම රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ඒවාට යමක් එකතු කිරීම හෝ ඒවා පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැක්කේ ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

*පදනම විසින් ගෙවනු ලැබිය සහ පදනමට අයවිය යුතු ණය.*

**7.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී පැවැති පදනම විසින් ගෙවිය යුතුව තිබූ සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන පදනම විසින් ගෙවිය යුතු අතර එදිනට පදනම අයවිය යුතුව තිබූ සියලු ණය සහ ලැබිය යුතුව තිබූ සම්මාදම් මුදල්, ප්‍රදාන සහ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා ගෙවනු ලැබිය යුතු ය.

*පදනමේ අරමුදල.*

**8.** (1) පදනමට එහිම අරමුදලක් තිබිය යුතු අතර, පදනම සඳහා සහ වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ, පැවරීම්, පරිත්‍යාග,සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන පදනම විසින් තීරණය කරනු ලබන පරිදි බැංකුවක හෝ බැංකු වැඩි ගණනක පදනමේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ පදනම සතු බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටුකිරීමේ දී කිරීමේ දී පදනම විසින් වියදම් කරන ලද සියලුම මුදල්, භාර අරමුදලින් ගෙවිය යුතු ය.

*පදනම විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.*

**9.** යම් මිලට ගැනීමකින් ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු බැහැර කිරීමකින් හෝ වෙනත් යම් ආකාරයකින් පදනම වෙත සතු කරනු ලබන යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් බලය හා හැකියාව ඇති අතර, එකී සියලු දේපළ පදනම විසින් මේ පනතේ කාර්ය සඳහා දැරිය යුතු ය. තව ද, පදනමේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් ව එකී දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ද පදනම සතු වන්නේ ය.

*සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.*

**10.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා හෝ ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික මුදල් ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

පදනම විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**11.** පදනම විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ භාරයේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, භාරයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදදීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

**12.** (1) පදනමට ලැබුණු සහ පදනම විසින් වියදම් කරනු ලැබූ සියලු මුදල් පිළිබඳව නිසි ගිණුම් පවත්වාගෙන යාමට පදනම විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) පදනමේ ගිණුම්, සෑම වර්ෂයකම යටත් පිරිසෙයින් එක් වරක් හෝ පරීක්ෂා කොට විගණනය කරනු ලැබිය යුතු අතර, පදනම විසින් පත් කරනු ලබන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු විය යුතු විගණකවරයෙක් හෝ විගණකවරයන් විසින් ආදායම් සහ වියදම් පිළිබඳ ගිණුම් සහ ශේෂ පත්‍රය සහතික කරනු ලැබිය යුතු ය.

පදනමේ මුද්‍රාව.

**13.** පදනමේ මුද්‍රාව පදනමේ සාමාජිකයන් දෙදෙනෙක් ඉදිරිපිට දී හැර කවර හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී තැනැත්තන් තමන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිභාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**14**. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් විසින් ඔවුන් යටතේ හිමිකම්පාන තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**15.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.